සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

12029

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- [redacted] විභාග අංකය :- ..........................

## I කොටස

❖ 01 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

❖ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.

(01) සමචතුරස්‍රයකට ඇති සමමිතික අක්ෂ ගණන කීය ද?

(02) P = {1 ත් 10 ත් අතර සමචතුරස්‍ර සංඛ්‍යා} නම්, P වෙන් රූපයක දක්වන්න.

(03) 30 හි ප්‍රථමක සාධක ලියන්න.

(04) 12, 18, 20 හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

(05) බලවල ගුණිතයක් ලෙස ලියන්න. a x b x a x b x b


(06) ක්‍රි.ව.1989.04.12 අයත්වන ශතවර්ෂය කුමක් ද?

(07) මිලිග්‍රෑම්වලින් ලියන්න. 2g 25mg

(08) ආරෝහණ පටිපාටියට ලියන්න.

0 , 6 , -1 , 2 , -3

(09) රූපයේ දී ඇති කෝණය නම් කරන්න.




(10) සුළු කරන්න. 15kg ÷ 4

To download past papers visit
www.vajirapani.blogspot.com

(11) පහත දැක්වෙන භාගය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.


$\frac{2}{25}$

(12) ත්‍රිකෝණයක පරිමිතිය 33cmකි. එහි පාදවල දිග අතර අනුපාතය 2 : 4 : 5 නම් ත්‍රිකෝණයේ දිගම පාදයේ දිග සොයන්න.

(13) හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව ලියන්න.

සරල රේඛීය තල රූපවලින් කරනු ලබන ටෙසලාකරණයක ශීර්ෂ ලක්ෂ්‍යයක් වටා වූ කෝණවල එකතුව සෘජුකෝණ ........................ ක් වේ.


(14) රූපයේ දැක්වෙන සමාන්තර රේඛා යුගල දෙකක් ලියන්න.




(15) එකතු කරන්න.

| km | m |
|---|---|
| 6 | 62 |
| 5 | 96 |
| | |

(16) රූපයේ දැක්වෙන්නේ වෘත්තයේ කේන්ද්‍රය O වේ.
AB හා CD හඳුන්වන විශේෂිත නම් ලියන්න.





AB - ..............................................

CD - ..............................................

(17) ධාරිතාව 200$ml$ වූ කුප්පියකින් පස් වාරයක දී බෝතලයක් මුළුමනින්ම පිරවිය හැක. බෝතලයේ ධාරිතාව

(i) මිලිලීටර කීය ද? (ii) ලීටර කීය ද?

(18) රූපයේ දී ඇති බහුඅස්‍රය සවිධි බහු අස්‍රයක් ද? හේතු දක්වන්න.



(19) දිග 10cm පළල 3cm හා උස 2cm වූ ඝනකාභ හැඩැති ලී කුට්ටියක අඩංගු ලීවල පරිමාව සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(20) මිනිත්තු 45 හා පැය 2 අතර අනුපාතය සරලව දක්වන්න.

11722

(04) (a) (i) $x$ හා $y$ අක්ෂ 0 සිට +9 දක්වා විහිදෙන කාටීසීය තලයක් අඳින්න. (කොටු රූල් කොළයක් භාවිත කිරීම වඩා සුදුසු ය.)

(ii) ඉහත කාටීසීය තලයේ පහත ලක්ෂ්‍ය ලකුණු කරන්න. සංවෘත රූපයක් ලැබෙන සේ එම ලක්ෂ්‍ය අනුපිළිවෙළින් යා කරන්න.

$A(5,1)$ $B(1,4)$ $C(3,7)$ $D(7,7)$ $E(9,4)$

(iii) ඉහත (ii) හි ඔබ ඇඳි රූපයේ සමමිති අක්ෂය ඇඳ දක්වන්න.

(b) පහත සිදුවීම් සඳහා 0 - 1 පරිමාණයට ලකුණු පිරිනමන්න.

(i) ගඟක ජලය පහළට ගැලීම

(ii) 1 සිට 6 තෙක් අංක කළ ඝනකාකාර දාදු කැටයක් ඉහළ දැමූ විට ත්‍රිකෝණ සංඛ්‍යාවක් ලැබීම

(05) කාඩ්බෝඩ්වලින් තනන ලද පියන සහිත ඝනකාභ හැඩැති පෙට්ටියක උස 40cm කි. එහි පතුල පැත්තක දිග 20cm වූ සමචතුරස්‍රයකි.

(i) ඉහත පෙට්ටියේ දළ රූපයක් ඇඳ දක්වන්න. (මිනුම් සහිතව)

(ii) එම පෙට්ටියේ ඇති සමචතුරස්‍රාකාර මුහුණත් ගණන කීය ද?

(iii) එම පෙට්ටියේ ඇති ඍජුකෝණාස්‍රාකාර මුහුණත් ගණන කීය ද?

(iv) මෙම පෙට්ටිය තැනීමට වැය වී ඇති කාඩ්බෝඩ්වල වර්ගඵලය සොයන්න.

(v) මෙම කාඩ්බෝඩ් පෙට්ටියේ පරිමාව සොයන්න.

(06) (a) 50න් ලකුණු දුන් ඇගැයීමකට සිසුන් සමූහයක් ලබාගත් ලකුණු ඇසුරින් පහත වෘන්ත පත්‍ර සටහන අඳින ලදී.

To download past papers visit www.vajirapani.blogspot.com


| වෘන්ත | පත්‍ර |
|---|---|
| 0 | 6 7 |
| 1 | 1 2 5 7 8 |
| 2 | 2 4 6 7 |
| 3 | 3 5 6 6 8 9 |
| 4 | 4 5 7 |

(i) මෙම වෘන්ත පත්‍ර සටහනේ සිසුන් කීදෙනෙකුගේ ලකුණු නිරූපණය වේද?

(ii) ලකුණුවල පරාසය සොයන්න.

(iii) ඇගැයීමට ලබාදුන් ලකුණුවලින් හරි අඩකට වඩා ලබා ඇති සිසුන්ගේ ප්‍රතිශතය සොයන්න.

(b) රූපයේ දී ඇති දත්ත ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) සමපාද ත්‍රිකෝණයක් නම් කරන්න.


(ii) ඍජුකෝණික ත්‍රිකෝණයක් නම් කරන්න.

(iii) විෂම පාද ත්‍රිකෝණයක් නම් කරන්න.

(iv) සුළු කෝණික ත්‍රිකෝණයක් නම් කරන්න.

(v) $PQ = 4cm$, $QR = 3cm$, $PR = 5cm$ නම්, PQRS රූපයේ පරිමිතිය සොයන්න.

(07) (a) 1cm කින් 20m ක් දැක්වෙන සේ සෘජුකෝණාස්‍රාකාර ඉඩමක් සඳහා අඳින ලද පරිමාණ රූපයක් පහත දැක්වේ.




(i) පරිමාණ රූපය ඇඳීමට භාවිත කළ පරිමාණය අනුපාතයක් ලෙස ලියන්න.

(ii) පරිමාණ රූපයේ වර්ගඵලය සොයන්න.

(iii) ඉඩමේ සැබෑ දිග හා පළල සොයන්න.

(b) පාදයක දිග 6.5cm වූ සමපාද ත්‍රිකෝණයක් නිර්මාණය කරන්න.

(c) පහත දී ඇති ප්‍රකාශ සත්‍ය නම් ✓ ලකුණ ද අසත්‍ය නම් × ලකුණ ද ඔබේ පිළිතුරු පත්‍රයේ අදාළ අංක යටතේ ලියන්න.

(i) එක් හැඩයක් පමණක් යොදාගත් ටෙසලාකරණ ශුද්ධ ටෙසලාකරණ වේ.

(ii) මහා කෝණික ත්‍රිකෝණයක විශාලම කෝණය $90^{\circ}$ට අඩුවේ.

(iii) ක්‍රි.ව. 2100 අධික වර්ෂයක් වේ.

(iv) 1 සිට 25 දක්වා ඔත්තේ සංඛ්‍යා ලියූ කාඩ්පත් කට්ටලයකින් අහඹු ලෙස කාඩ්පතක් ගත් විට ලැබිය හැකි ප්‍රතිඵල ගණන 12කි.

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සූත්‍ර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න